4112

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ..................................................  විභාග අංකය :- ........................

සැලකිය යුතුයි:

- I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසට අමුණා බාර දෙන්න.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හා වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පුද්ගල සිතුවිලි වලට බලපෑමක් කරන ප්‍රධානතම සාධකය වන්නේ,
(1) ප්‍රජාව හා ආයතනය  (2) පවුල ය.
(3) ආගමික සිද්ධස්ථාන ය.  (4) පාසල ය.

(02) පුද්ගලයා තුළ හටගන්නා විවිධ චිත්තවේග අනුව විවිධ ප්‍රතික්‍රියා හා හැසිරීම් පෙන්නුම් කරයි. ඒ අනුව කෝපයට පත් වූ විට ඇතිවන හැසිරීම් දක්වෙන පිළිතුර තෝරන්න.
(1) සුසුම් හෙළීම, මුහුණ රතුවීම, අතපය වෙව්ලීම
(2) සුසුම් හෙළීම, කෑගැසීම, සිනාසීම
(3) මුහුණ රතුවීම, වචන පැටලීම, අතපය වෙව්ලීම
(4). මුහුණ රතුවීම, උඩ පැනීම, අතපය වෙව්ලීම

(03) "අභිමානයෙන් යුක්තව පයින් ගමන් කිරීම, අවමානයෙන් යුක්තව බස්වල ගමන් කරනවාට වඩා ගෞරව සම්පන්න බව" ප්‍රකාශ කරමින් ඇමරිකානු සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කල උදාර නායකයා වන්නේ,
(1) වින්ස්ටන් චර්චිල් ය.
(2) ශ්‍රී ජවහර්ලාල් නේරු ය.
(3) මාටින් ලූතර් කිං ය.
(4) ජෝර්ජ් වොෂින්ටන් ය.

(04) අලුත් සහලින් කිරිබත් පිස හිරු දෙවියන් උදෙසා පූජාකර, ගොවිතැනට උදව් වූ ගවයන්ට පූජෝපහාර දක්වන හින්දු ආගමික උත්සවය වනුයේ,
(1) මහා ශිව රාත්‍රී උත්සවය යි.
(2) දීපවාලි උත්සවය යි.
(3) හජ්ජ් උත්සවය යි.
(4) තෛපොංගල් උත්සවය යි.



181

(05) පොදු සේවා සැපයීමේ දී රජය මඟින් ''නොමිලේ'' සැපයෙන සේවාවන් වන්නේ,

(1) විදුලිය හා අධ්‍යාපනය යි. (2) විදුලිය හා සෞඛ්‍යය සේවය යි.

(3) අධ්‍යාපනය හා ජල සම්පාදනය යි. (4) අධ්‍යාපනය හා සෞඛ්‍යය සේවය යි.

- අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(ස්ථිරසාර, දෘඩ් තීරණගැනීම, ආදරය, අරපිරිමැස්මෙන්, ස්වයං විනය, කාංසාව)

(06) පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණයක් ලෙස ........................................ හා ඒකවරණය හැඳින්විය හැකි ය.

(07) නායකයෙකු සතු නායකත්වය ගුණාංගයක් ලෙස ........................................ බව හැඳින්විය හැකි ය.

(08) පොදු සේවාවන් පරිහරණය කරන්නෙකු හැටියට ඒවා ........................................ පරිහරණය කිරීම යුතුකමකි.

(09) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක ප්‍රධාන අංග ලක්ෂණයක් ලෙස ........................................ සැලකේ.

(10) ආවේගශීලීව කටයුතු කිරීම නිසා ........................................ චිත්තවේගය හටගනී.

- ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(11) වගුරු බිම් ගොඩකිරීම ගංවතුර ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකමකි. ( )

(12) ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින් ළමයින් ලෙස පිළිගැනේ. ( )

(13) කායික හෝ මානසික ශ්‍රමය විශේෂිත කාර්යයක් ඉටුකිරීම සඳහා පුහුණු කරවීම මඟින් ''පුහුණු ශ්‍රමය'' ලබාගත හැකිය. ( )

(14) ගැටුම් වලක්වා ගැනීම සඳහා එය කල්තබා හඳුනාගැනීම ඵලදායී ක්‍රියාවක් ලෙස නොසැලකේ. ( )

(15) අයහපත් චිත්තවේග තත්වයන් දිගින් දිගටම පැවතීම පුද්ගලයකු කායික, මානසික හා සමාජීය වශයෙන් පිරිහීමට පත් වීමට හේතු වනු ඇත. ( )

The National e-learning Portal for The General Education

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා **X** කොටසේ ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර **Y** කොටසින් තෝරා ඊට අදාල අක්ෂරය වරහන තුළ ලියන්න.

| | X කොටස | | | Y කොටස |
|---|---|---|---|---|
| (16) | විවිධ ජන වර්ග, විවිධ ආගම් ඇදහීම, විවිධ සංස්කෘතීන් පැවතීම. | (   ) | (a) | නායයාමක මූලික ලක්ෂණ වේ. |
| (17) | ලිං හා උල්පත් ජලය බොරවීම, මතුපිට ගල් පෙරලීම, සතුන්ගේ හැසිරීම. | (   ) | (b) | ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ලක්ෂණ වේ. |
| (18) | උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විදීම, සාමාකාමීව ගැටලු නිරාකරණයට යොමු වීම, විනය නීතිවලට අවනත වීම. | (   ) | (c) | සුභවාදී සිතුවිලි වේ. |
| (19) | ඔව්. මට පුළුවන්. මම ජයගනිමි. මම විශිෂ්ඨයෙකු වෙමි. | (   ) | (d) | බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ වේ. |
| (20) | පොදු දේපල සුරැකීම, යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය, නිසි අධ්‍යාපනය ලැබීම. | (   ) | (e) | පුරවැසියෙකු සතු අයිතිවාසිකම් වේ. |
| | | | (f) | සුනාමි තත්වයන් ඇතිවීමට පෙර පරිසරයේ ඇතිවන වෙනස්කම් |

(ලකුණු 2 × 20 = 40)

The National e-learning Portal for The General Education

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- නවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) ඔබ විසින් තුන්වන වාරය තුළ ක්‍රියාත්මක කල "වැඩ ලෝකය පිළිබඳ ගවේෂණය" ආශ්‍රිත ක්‍රියාකාරකම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ඉහත ක්‍රියාකාරකම ඉටුකිරීම සඳහා ගුරුතුමා, ගුරුතුමිය ඔබට ලබාදුන් උපදෙස් 2ක් ලියන්න. (ලකුණු 02)

(2) රැකියා කරන්නෙකු තුළ තිබිය යුතු සුදුසුකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(3) පුද්ගලයෙකුට රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීමේදී තිබිය යුතු සුදුසුකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(4) රැකියා කරන්නෙකු තුළ තිබිය යුතු ඔබ හඳුනාගත් ගුණාංග 2ක් ලියන්න. (ලකුණු 02)

(5) ඔබ විසින් ගවේෂණය කල ආයතනයේ දී ඔබට හමුවූ කාර්ය මණ්ඩලයේ සිටි පුද්ගලයන්ගේ තිල නාම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(6) මෙම ක්‍රියාකාරකම කිරීමේ දී ඔබට මතු වූ ගැටළු 3ක් ලියන්න. (ලකුණු 03)

(7) ඉහත ක්‍රියාකාරකම තුළින් ඔබ ලද අත්දැකීම් තුනක් දක්වන්න. (ලකුණු 03)

(02) (1) පුද්ගලයා තුළ හටගන්නා චිත්තවේග ප්‍රධාන වශයෙන් වෙන්කරනු ලබන ක්‍රම දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

(2) අයහපත් සිතුවිලි නිසා පුද්ගයෙකුට විඳීමට සිදුවන අවාසි හතරක් ලියන්න. (ලකුණු 04)

(3) සිතුවිලි යහපත් කරගැනීමට යොදාගත හැකි ක්‍රම දෙකක් නම් කර එසේ කිරීම තුළින් ලැබෙන වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(03) (1) ගැටුම්කාරී අවස්ථාවක් ඇතිවීම සඳහා බලපාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ගැටුම් වලක්වාගැනීමේ ක්‍රමවේද හතරක් ලියන්න. (ලකුණු 04)

(3) ඔබ පන්තිකාමරයේ සිදුවූ ගැටුමක් විසඳීම සඳහා මැදිහත්කරුවකු ලෙස ඔබට ක්‍රියාකිරීමට සිදුවූයේ නම් ඒ සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග 3ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (1) වර්තමානයේ මිනිසාට විවිධ විපත්වල මුහුණදීමට සිදුවේ. එවැනි විපත් කීපයක් පහත වරහන් තුළ දක්වේ. ඒවායින්.

A. ස්වභාවික විපත් දෙකක් ද

B. මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන විපත් දෙකක් ද A, B අනුපිළිවෙලින් ලියා දක්වන්න.

(භූ චලන, රිය අනතුරු, නාය යෑම්, ආහාර විසවීම, හදිසි අනතුරු, සුනාමි) (ලකුණු 02)

(2) රියදුරන් අතින් සිදුවන වැරදි නිසා මහාමාර්ග අනතුරු බහුල වේ. රියදුරන් අතින් සිදුවන වැරදි හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) පුරවැසියෙකු වශයෙන් විපතක් සිදු වූ විට ඔබ විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (1) බහු සංස්කෘත ජන සමාජයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) විවිධ සංස්කෘතීන් ගොඩනැගී ඇත්තේ ආගම් මුල්කරගෙනය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි සංස්කෘතීන් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතියක් පැවතුනත් ඔවුන් එක්ව කටයුතු කරන අවස්ථා 3ක් සඳහන් කර එසේ කිරීමට හේතු විස්තර කරන්න. (ලකුණු 05)

(06) සියලු ජනතාවට පොදුවේ සපයන සේවා පොදු සේවා හැටියට සලකනු ලැබේ.

(1) සහන ගෙවීම් යටතේ සපයන පොදු සේවා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) a. දිසා රෝහලක කාර්යමණ්ඩලයේ නිලනාමයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

b. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයකින් ජනතාව වෙනුවෙන් ඉටුකරනු ලබන සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) පොදු සේවා පරිභරණය කරන්නෙකු ලෙස විදුලිය පරිභරණය කිරීමේ දී ඔබ විසින් පිළිපැදිය යුතු යුතුකම් හා වගකීම් 05ක් ලියන්න. (ලකුණු 05)

(07) (1) පහත A හා B රූපසටහන් වලින් දක්වෙන්නේ ජනතාව වෙනුවෙන් කටයුතු කළ උදාර නායකයන් දෙදෙනෙකුගේ පින්තූර වේ. එම නායකයන් දෙදෙනා හඳුනාගෙන A, B අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 02)

A



B



(2) නූතනයේ විවිධ නායකත්ව ශෛලීන් හඳුනාගෙන ඇත. එම නායකත්ව ශෛලීන් අතුරින් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(3) ඔබට ඔබ පන්තියේ පන්ති නායකයෙකු වීමට අවස්ථාවක් ලැබුනේ නම් පන්තියේ අනෙක් යහළුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබ තුළ ඇති කරගන්නා ගුණාංග දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

The National e-learning Portal for The General Education